# සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය
# රැකියා පුරප්පාඩු

NCGI
National Credit Guarantee Institution

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා රජය හා ප්‍රමුඛ පෙළ මූල්‍ය ආයතන 13ක් එක්ව ස්ථාපිත කර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කරිතාවයක් සහිත ආයතනයකි. මෙම ආයතනය සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ණය ඇපකර සපයන අතර ආර්ථික වර්ධනය සහ සමෘධිය ප්‍රවර්ධනය කරන ශක්‍ය ව්‍යපෘතින් සඳහා මුදල් ප්‍රවාහ මත පදනම් කරගත් ණය ලබාදීම ප්‍රවර්ධනය කරයි.

අප සොයන්නේ කැපවූ, ශක්තිමත් සන්නිවේදන කුසලතා ඇති, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පද්ධතිය පිළිබඳ මනා දැනුමක් ඇති, සවිස්තරාත්මකව අවධානය යොමු කිරීමට හැකියාව ඇති සහ ඉහළ කාර්ය සාධනයක් සහ කණ්ඩායම් සාමාජිකයින් සමග ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව ඇති පුද්ගලයන්ය.

**ඔබ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනයට බලපෑමක් ඇති කිරීමට හැකි අපේක්ෂකයෙක් නම්, අප හා එක්වන්න!**

## ප්‍රධාන සුදුසුකම්, පළපුරුද්ද සහ වගකීම

| | |
|---|---|
| **ප්‍රධාන පරිපාලන නිලධාරී / ප්‍රධාන මූල්‍ය නිලධාරී**<br><br>**මූල්‍ය, ප්‍රසම්පාදන සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයන්හි නායකත්වය සපයන අතර, මූල්‍ය කාර්ය සාධනය, නියාමන අනුකූලතාව සහ තිරසාරභාවය අධීක්ෂණය කරයි. තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සහ මෙහෙයුම් මෙහෙයවීම, ව්‍යාපාර අඛණ්ඩතාව සහ අවදානම් අවම කිරීම සහතික කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස උපායමාර්ගික තීරණ ගැනීම සඳහා දායක වේ.**<br><br>*කාර්ය සාධනය මත පදනම්ව වසර 03ක නැවත අලුත් කිරීමේ කොන්ත්‍රාත්තුවක් මත පදනම් වූ තනතුරකි. | • වරලත් ගණකාධිකාරී සුදුසුකම හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක්.<br>• මූලික උපාධියක් හෝ මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය සුදුසුකම්.<br>• මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන ක්ෂේත්‍රවල අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද සහ මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන ක්ෂේත්‍රවල තනතුරුවල අවම වශයෙන් වසර 2ක කාලයක ප්‍රායෝගික පළපුරුද්ද.<br>• වයස අවුරුදු 40 – 57 වීම වඩාත් සුදුසුය. |
| **ප්‍රධාන හිමිකම් නිලධාරී**<br><br>**හිමිකම් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යයන් ආවරණය කරමින් නියාමන අනුකූලතාවයට අනුකූලව විසඳුම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම ඇතුළු මෙහෙයුම් ක්‍රියාවලීන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු නායකත්ව තනතුරකි.**<br><br>*කාර්ය සාධනය මත පදනම්ව වසර 03ක නැවත අලුත් කිරීමේ කොන්ත්‍රාත්තුවක් මත පදනම් වූ තනතුරකි. | • පිළිගත් ආයතනයකින් බැංකුකරණ සුදුසුකම් ලබා තිබීම.<br>• පිළිගත් ආයතනවලින් ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් පිළිබඳ උපාධියක් හෝ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබීම.<br>• බැංකුකරණයේ හෝ ඒ ආශ්‍රිත රැකියා කටයුතුවල සමස්ත වසර 10 ක සේවා පළපුරුද්දක් සහ මූල්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබීම.<br>• පෞද්ගලික අංශයේ ප්‍රායෝගික පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.<br>• වයස අවුරුදු 40 – 57 වීම වඩාත් සුදුසුය. |
| **කළමනාකරු - හිමිකම්**<br><br>හිමිකම් දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ ක්‍රියාකාරිත්වය ආවරණය කරමින් නියාමන අනුකූලතාවයට අනුගත වෙමින් සැලසුම්කරණය ,ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය ද ඇතුලත්ව මෙහෙයුම් ක්‍රියාපටිපාටිය පලදායි අයුරින් කළමනාකරණය සම්බන්ධව වගකීම දරයි.<br><br>* ස්ථිර හා පූර්ණකාලින තනතුරකි. | • පිළිගත් ආයතනයකින් බැංකුකරණ සුදුසුකම් ලබා තිබීම.<br>• පිළිගත් ආයතනවලින් ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය හෝ අදාළ ක්ෂේත්‍රයක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් පිළිබඳ උපාධියක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.<br>• මූල්‍ය ආයතනවල කළමනාකරණ තනතුරක අවම වශයෙන් අවුරුදු 04 ක පළපුරුද්දක් තිබීම.<br>• වයස අවුරුදු 35 - 45 අතර වීම වඩාත් සුදුසුය. |
| **විධායක නිලධාරී - සුරැකුම් පරිපාලන**<br><br>ඇප සහතික පරිපාලන ක්‍රියා පටිපාටිය සඳහා පහසුකම් සපයමින් එයට අයත්වන මූලික ණය විශ්ලේෂණය සිදු කිරීම ,ණය ආයෝජනය යාවත්කාලීන කිරීම,ණය ගැනුම්කරුවන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කිරීම , ණය ගැනුම්කරුවන් ලියාපදිංචිය ,වාර්තා පවත්වාගැනීම වාර්තාකරණය.<br><br>*ස්ථිර හා පූර්ණකාලින තනතුරකි. | • පිළිගත් ආයතනවලින් වාණිජ, ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br>• බැංකු සුදුසුකම් තිබීම අමතර වාසියක් ලෙස සලකනු ලැබේ.<br>• සාමාන්‍ය බැංකුකරණයේ අවම වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්දක් හෝ බැංකුවක / මූල්‍ය ආයතනයක MSME ණය දීමේ පළපුරුද්ද තිබීම වඩාත් සුදුසුය.<br>• මයික්‍රෝසොෆ්ට් ඔෆිස් මෘදුකාංග යෙදුම් සහ ICT සාක්ෂරතාවය පිළිබඳ ප්‍රවීණතාවය අනිවාර්ය වේ.<br>• වයස අවුරුදු 25 - 40 අතර වීම වඩාත් සුදුසුය. |

* *අයදුම්පත් කැඳවනු ලබන්නේ* ***කොළඹ ප්‍රදේශයේ සේවය කිරීමට කැමති අපේක්ෂකයින්ගෙන් පමණි.***

**වැටුප් පැකේජ:** තෝරා ගත් අයදුම්කරුවන් සඳහා ආකර්ශනීය වැටුප් පැකේජයක් හිමිය.
**තෝරා ගැනීමේ ක්‍රමවේදය:** පරිපූර්ණ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් තුලින් තෝරාගැනීම් සිදු කරනු ලබන අතර,සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුමකරුවන්හට පමණක් එම තෝරාගනු ලබන ක්‍රියාවලි තුල සියලු අදියරවලදී දැනුම් දෙනු ලබන බව කරුණාවෙන් සලකන්න.

මේ සම්බන්ධව ඔබ කැමැත්තක් දක්වන්නේ නම්, හා අදාල අවශ්‍යතා සපුරාලිය හැකි නම්, කරුණාකර ඔබගේ සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාව, PDF ආකෘතියෙන් ඥාති නොවන නිර්දේශිකයන් දෙදෙනකුගේ ඊමේල් ලිපි සමග මෙම දැන්වීම පලවී දින 7 ඇතුළත careers@ncgil.lk වෙත යොමු කරන්න.

**ජාතික ණය සුරැකුම් ආයතනය,**
**මහ ලේකම් කාර්යාලය, 321, 3 වන මහල, ලෝටස් පාර, කොළඹ 01**

www.ncgil.lk